ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
லலித் அத்துலத்முதலி மஹபொல உயர்க்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்
LALITH ATHULATHMUDALI MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND

8 වන මහල, සතොස මහලේකම් ගොඩනැගිල්ල, 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02, ශ්‍රී ලංකා.
8வது மாடி ,சதொச செயலகக் கட்டிடம் இல 27,வொக்ஷொல் வீதி,கொழும்பு 02.
8TH Floor, CWE Secretariat Building, No.27, Vauxhall Street, Colombo 02, Sri Lanka

| මගේ අංකය / எனது இல / My No. | MTF/1/1/1(2020/2021) | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2023.07. 21 |
|---|---|---|---|---|---|

1. උපකුලපති,
කොළඹ, පේරාදෙණිය, කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර, මොරටුව, යාපනය, රුහුණ, නැගෙනහිර, අග්නිදිග, සබරගමුව, රජරට, වයඹ, ඌව වෙල්ලස්ස, සෞන්දර්ය කලා, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, වවුනියා විශ්වවිද්‍යාලය

2. අධ්‍යක්ෂ,
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක පාසල, ස්වාමි විපුලානන්ද ආයතනය

3. මණ්ඩපාධිපති,
ශ්‍රී පාලි මණ්ඩපය, නැගෙනහිර විශ්ව විද්‍යාලය (ත්‍රිකුණාමල මණ්ඩපය),

මහත්මයාණනි/මහත්මියණි,

**<u>මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය - 2020/2021</u>**

2020/2021 ප්‍රවේශිත වර්ෂයේ ශිෂ්‍යත්ව ප්‍රදානයට අදාල මහපොළ ශිෂ්‍යත්වලාභී සිසුන්ගේ නාම ලේඛණය, විද්‍යුත් තැපැල් මගින්, ඔබ විශ්ව විද්‍යාලය වෙත ගෙවීම් ලේඛණ එවීමට ලබාගත් E-mail ලිපිනයන් වෙත යොමු කරනු ලැබේ.

02. මෙම මහපොළ ශිෂ්‍යත්වලාභී නාම ලේඛණය ඔබ විශ්ව විද්‍යාලයේ නාම පුවරුවේ ප්‍රදර්ශනය කරන මෙන් කාරුණිකව ඉල්ලමි. එහිදී මහපොළ ශිෂ්‍යත්ව හිමි සිසුන්ට මහපොළ ශිෂ්‍යත්ව ලියාපදිංචිය සඳහා වන ආකෘති පත්‍රය www.mahapola.lk මහපොළ වෙබ් අඩවියට පිවිස සිය ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කර භාගත කොට, සම්පූර්ණ කරන ලද ලියාපදිංචි අයදුම්පත සෘජුවම ( Online ) මහපොළ අරමුදල වෙත 2023.08.10 දිනට පෙර යොමුකල යුතු බව දැන්වීමට කටයුතු කරන්න.

03. ඉහත Online මගින් යොමුකරන ලද මහපොළ ශිෂ්‍යත්ව ලියාපදිංචි ආකෘති පත්‍රයේ පිටපතක් ශිෂ්‍යත්වලාභියාගේ අත්සන සහිතව විශ්ව විද්‍යාලය වෙත ලබාදිය යුතු බවට සිසුන් දැනුවත් කොට විශ්ව විද්‍යාලය වෙත ලබා ගන්න. මෙම සිසුන්ගේ ශිෂ්‍යත්ව වාරික මුදල් බැර කිරීම සඳහා වන ගිණුම් අංකය ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ පමණක් විය යුතු බව සිසුන්ට දන්වන්න. දැනට එම බැංකුවල ගිණුම් නොමැති සිසුන්හට නව බැංකු ගිණුමක් ඇරඹීමට දැනුම් දෙන්න. ආකෘති පත්‍රයට අනුව වන ගිණුම් අංක පරීක්ෂා කිරීම ඔබ විශ්ව විද්‍යාලය මගින් සිදුකල යුතුවේ. එය අප විසින් ලබාදුන් මහපොළ ශිෂ්‍යත්වලාභී ලේඛණයට ඇතුලත් කර අප වෙත එවීමෙන් පසු ගෙවීම් ලේඛණවලට එම තොරතුරු ඇතුලත්කර ගෙවීම් කරනු ලබේ.

04. 2020/2021 ප්‍රවේශිත වර්ෂ මෙම ශිෂ්‍යත්වලාභීන්ගේ ගෙවීම් 2023 අගෝස්තු මාසයේ සිට ආරම්භ කිරීම සඳහා ඔවුන්ගේ අධ්‍යයන වර්ෂය ආරම්භ කරන ලද දිනය ( එක් එක් පාඨමාලාවට අදාල වන සේ ), 2023 ජූලි මාසය දක්වා වන අධ්‍යයන නිවාඩු මාසද සමඟ ගෙවිය යුතු හිඟ වාරික, අදාල වන මාස සඳහන් කර පෙර වර්ෂයේ දී මෙන් අදාල E-mail ලිපිනයන් වෙත එවීමට කටයුතු කරන මෙන් ඉල්ලමි.

05. සියලුම ශිෂ්‍යත්වලාභී සිසුන් (2020/2021) පාඨමාලා සඳහා සක්‍රීයව සහභාගී වන බව , ඒ ඒ පීඨ මඟින් සහතික කොට පීඨාධිපතිවරුන්ගේ සහතිකයක්ද සමඟ මහපොළ අරමුදල වෙත නොපමාව යොමු කරන ලෙස දන්වන අතර එම පාඨමාලාවලට සහභාගී වීම පිළිබඳ ලේඛන එක් එක් සිසුවාට වනසේ සකස් කොට එවන ලෙස ද තවදුරටත් දන්වමි.

06. මේ වන විටත් විශ්ව විද්‍යාලය මඟින් මහපොළ ශිෂ්‍යත්වලාභී සිසුන් සඳහා ශිෂ්‍යාධාර මුදල් ගෙවා ඇත්නම් විශ්ව විද්‍යාලයට අයවිය යුතු ශිෂ්‍යාධාර මුදල් පිළිබඳ තොරතුරුද ලබාදෙන මෙන් වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

මෙයට - විශ්වාසී,

දුරකථන:- 0112685011
ෆැක්ස් :- 0112675524
Email:- mahapoladirector@gmail.com

පරාක්‍රම බණ්ඩාර,
අධ්‍යක්ෂ,
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.

පිටපත් :

1. ලේකම්,වෙළෙඳ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය .
2. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
3. ලේකම්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
4. ගණකාධිකාරී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
5. පීඨාධිපති , සියලුම පීඨ.

(1–5) -දැ.ගැ.ස.

6. ලේඛකාධිකාරී.
7. ලේඛකාධිකාරී(ශිෂ්‍ය සේවා)/නියෝජ්‍ය ලේඛකාධිකාරී

(6–7) -අ.ක.ස.